# විශේෂ අධ්‍යාපන පන්තිකාමරවල භාෂා සහ සමාජ අන්තර්ක්‍රියා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නවීන නාට්‍ය ශිල්පීය ක්‍රමවල සඵලතාවය පිළිබඳව අධ්‍යයනයක්

*කේ.එන්. මධුශංක* [1]

විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයන් අතර සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සහ සමාජ අන්තර්ක්‍රියා වැඩි දියුණු කිරීම සඳහා භූමිකා රඟ දැක්වීම, කතන්දර කීම, රූකඩ නාට්‍යය සහ අභිනය මත පදනම් වූ නවීන නාට්‍ය ශිල්පීය ක්‍රමයන් වැදගත් වේ. විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයන්ගේ භාෂා සහ සමාජ අන්තර්ක්‍රියා කුසලතා ඵලදායී ලෙස වර්ධනය කිරීමට බාධා කරන ප්‍රමාණවත් නොවන අන්තර්ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවල අභියෝගය වටා පර්යේෂණ ගැටළුව කේන්ද්‍රගත වේ. ඒ අනුව මූලික පරමාර්ථය, මෙම ශිල්පීය ක්‍රම මගින් වාචික සහ වාචික නොවන සන්නිවේදනය, සමාජ නියැලීම සහ සමස්ත පන්තිකාමර සහභාගීත්වය වැඩිදියුණු කළ හැකි ආකාරය ඇගයීමයි. අධ්‍යයනයේ අරමුණ වන්නේ නාට්‍යයේ ව්‍යුහගත සහ නිර්මාණාත්මක අංගවලට විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා ප්‍රවේශ විය හැකි සන්නිවේදන මාධ්‍යයක් සැපයිය හැකි බවත්, ඔවුන්ගේ සමාජ හා චිත්තවේගීය වර්ධනයට පහසුකම් සැලසිය හැකි බවත් පෙන්වා දීමයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී දොඩම්වල විශේෂ අවශ්‍යතා පාසල පදනම්ව ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව අරමුණු සහගත නියැදිය ඔස්සේ ගුරුවරුන් පස් දෙනෙකු, අධ්‍යාපන නිලධාරීන් පස් දෙනෙකු සහ ශිෂ්‍යයන් විස්සක් ඇතුළු සාමාජිකයන් තිස් දෙනෙකු සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ පන්ති කාමර නිරීක්ෂණ මගින් දත්ත රැස් කෙරුණි. වාචික සන්නිවේදනය වැඩි කිරීම, වාචික නොවන අන්තර්ක්‍රියා වැඩි දියුණු කිරීම, සම වයසේ මිතුරු සබඳතා වැඩිදියුණු කිරීම, ස්වයං ප්‍රකාශනය ඉහළ නැංවීම සහ පන්තිකාමර සහභාගීත්වය වැඩි කිරීම යන ප්‍රධාන තේමා පහක් හඳුනා ගනිමින් තේමාකරණය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵලවලින් පෙනී යන්නේ නාට්‍ය ශිල්පීය ක්‍රම මඟින් භාෂා අත්පත් කර ගැනීම සහ භාෂා භාවිතය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන බවත්, වඩා හොඳ සම වයසේ මිතුරන් අතර අන්තර් ක්‍රියා සඳහා පහසුකම් සැලසීම, ස්වයං ප්‍රකාශනය දිරිමත් කිරීම, චිත්තවේගීය නියාමනය ප්‍රවර්ධනය කිරීම සහ පන්ති ක්‍රියාකාරකම් සඳහා වඩාත් ක්‍රියාකාරී සහභාගීත්වය ඇති කිරීමට හේතු වන බව සොයාගැනීම්වලින් හෙළි විය. ඒ අනුව අධ්‍යයනයේ නිගමනය වන්නේ නවීන නාට්‍ය ශිල්පීය ක්‍රම ශාස්ත්‍රීය හා සමාජීය ප්‍රතිලාභ ලබා දෙන විශේෂ අධ්‍යාපනය සඳහා වටිනා මෙවලමක් බවයි. ප්‍රධාන වශයෙන් විගොට්ස්කිගේ සමාජ සංවර්ධනය න්‍යාය, බන්දූරාගේ සමාජ ඉගෙනුම් න්‍යාය සහ නාට්‍ය චිකිත්සාව පිළිබඳ අධ්‍යයනයන් සඳහා ද මෙම පර්යේෂණය සහාය දක්වයි.

***ප්‍රමුඛ පදඃ*** නාට්‍ය ශිල්පීය ක්‍රම, පන්තිකාමර ක්‍රියාකාරකම්, භාෂා කුසලතා, විශේෂ අධ්‍යාපනය, සමාජ අන්තර්ක්‍රියා

[1] අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
nimeshmadushanka2020@gmail.com